# මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
# நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
# MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01. இலங்கை. | The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700

ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823

වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: PFD/RED/REG/CIR/2024

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2024.08. 30

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක: 01/2020 (IV)

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
පළාත් පාලන ආයතන ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය බැංකු, විශ්ව විද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල ප්‍රධානීන් හා රජය සතු සමාගම්වල සභාපතිවරුන්

**1992 මුදල් රෙගුලාසි සංග්‍රහය යටතේ නිකුත් කොට ඇති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි 6 ඡේදය සංශෝධනය කිරීම**

2020.08.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි II කොටසේ 6 ඡේදය **"රජයට අවශ්‍ය හදිසි සේවා ඉටුකිරීම වෙනුවෙන් ගාස්තු ගෙවීම"** යටතේ සඳහන් 6.2 අනු ඡේදය 6.2 (අ) ලෙස අංකනය කරන අතර, 6.2 (ආ) ලෙස නව අනු ඡේදයක් පහත සඳහන් පරිදි ඇතුළත් කරනු ලැබේ.

**6.2 (ආ)** අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන විද්වත් කමිටු/ නිලධාරී කමිටු වෙත පවරනු ලබන යම් අපේක්ෂිත කාර්යභාර පැවරුමක් (Assignment) උපරිම දින 180 ක කාල සීමාවක් තුළ අවසන් කළ යුතු අතර, එම සම්පූර්ණ කාර්යභාර පැවරුම වෙනුවෙන් අමාත්‍ය මණ්ඩලය විසින් නියම කරනු ලබන ගාස්තුව හෝ එසේ ගාස්තුවක් නියම කර නොමැති අවස්ථාවල දී එකී කමිටුවල සභාපති/ සාමාජිකයෙකු සඳහා උපරිම රු.100,000/- ක සීමාවකට යටත්ව ගෙවීම් සිදු කල හැකි ය. කෙසේ වුව ද, රජයේ හෝ අර්ධ රාජ්‍ය සේවයේ දැනට සේවය කරනු ලබන නිලධාරීන් මෙන්ම රජයේ හෝ අර්ධ රාජ්‍ය සේවයේ තනතුරක නැවත සේවයේ යොදවා ඇති විශ්‍රාමික රජයේ හෝ අර්ධ රාජ්‍ය සේවයේ නිලධාරීන් උක්ත ගෙවීම සඳහා හිමිකම් නොලබයි.

02. උක්ත චක්‍රලේඛයේ 6.4 අනු ඡේදයෙහි සඳහන් විධිවිධාන පහත පරිදි සංශෝධනය කෙරේ.

ඉහත 6.2 (ආ) හි සඳහන් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන විද්වත් කමිටු/ නිලධාරී කමිටු සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් ගෙවිය යුතු ගාස්තුව හා කාල රාමුව නියම කරන අවස්ථාවන්හි දී හැර, ඉහත 6.2 (අ) සහ (ආ) හි සඳහන් සීමාවන් ප්‍රමාණවත් නොවන අවස්ථාවල දී, එම සීමාවන්ගෙන් බැහැර වීමට හේතු වූ කරුණු පැහැදිලි කරමින් ගණන්දීමේ නිලධාරියාගේ සහ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ නිර්දේශ සහිත ඉල්ලීමක් මහා භාණ්ඩාගාර අනුමැතිය සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්

කළ යුතු අතර, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් එසේ ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා/ භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ඇත.

03. 2020.08.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි II කොටසේ 6 ඡේදය හි සඳහන් අනෙකුත් විධිවිධාන ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කෙරේ.

**කේ.එම්. මහින්ද සිරිවර්ධන**
භාණ්ඩාගාරයේ ලේකම්

පිටපත්:
01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. අමාත්‍ය මණ්ඩල ලේකම්
04. විගණකාධිපති